# සාමාන්‍ය සමයේ විසි වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 56: 1, 6–7

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

මාගේ ගිවිසුම ස්ථිරව පවත්වන විදේශිකයන්
මගේ ශුද්ධ කන්දට පමුණුවා ගන්නෙමි.

සමිඳාණෝ සිය සෙනගට මෙසේ වදාරණ සේක. "යුක්තිය ඉටු කර හරි දේ කරන්න. මම නුඹලා නොපමා ව මුදන්නෙමි. මාගේ විමුක්තිය එළිදරව් වනු ඇත.

සමිඳුන්ට සේවය කර, එතුමන්ට ප්‍රේම කර, එතුමන්ගේ මෙහෙකරුවන් වන පිණිස එතුමන් සරණ ගිය, සබත් දවස පවත්වා එය නොකෙලෙසන මාගේ ගිවිසුම ස්ථිරව පවත්වන විදේශිකයන් ද මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ප්‍රීති කරවන්නෙමි. ඔවුන්ගේ දවන යාග පූජා හා පුද පූජා මාගේ පූජාසනය පිට පිළිගනු ලබන්නේ ය. මන්ද, මාගේ දේව මාළිගාව සියලු ජාතීන් හට යාච්ඤා ගෘහය ය"යි කියනු ලබන්නේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 67: 1–2, 4,7

පිළිතුර : අහෝ දෙවිඳුනි, ජනතාවෝ ඔබ පසසත්වා!

ගීය : දෙවිඳාණෝ අප වෙත දයා ව පෙන්වමින්
අපට ආශීර්වාද කරන සේක් වා!
එවිට මුළු ලොව ඔබේ කැමැත්ත දැන ගන්නේ ය.
සියලු විජාතිහු ඔබේ ගැළවීමේ බලය දැන ගන්නෝ ය.

ඔබ සාධාරණ ලෙස මිනිසුන් විනිශ්චය කරන සේක.
මිහි පිට සියලු විජාතීන් හට ඔබ මඟ පෙන්වන සේක;
එබැවින් සකල ජනයා ප්‍රීතිමත් ව සතුටින් ගී ගයත් වා!

අපේ දෙවිඳාණෝ අපට ආසිරි වස්වන සේක් වා!
පොළෝ වැසි සියල්ලෝ එතුමන්ට ගරු කරත්වා!

## දෙවන දේව ප්‍රකාශනය රෝම 11: 13–15, 29–32

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### දෙවියන් වහන්සේ සිය දීමනා ද, කැඳවීම ද, වෙනස් නොකරන සේක.

දැන් මා කතා කරන්නේ විජාතීන් වන ඔබට ය. විජාතීන්ට ප්‍රේරිතයෙකු ව සිටින බැවින් මම මාගේ මෙහෙය උසස් කොට සලකමි. එසේ සලකන්නේ යම් හෙයකින් මාගේ ම ජාතියේ සෙනඟ උනන්දු කරවා ඔවුන්ගෙන් සමහරකු ගළවා ගන්නා පිණිස ය. මන්ද, ඔවුන් ප්‍රතික්ෂේප කිරීම, ලෝකයා දෙවියන් වහන්සේ හා සමගි කිරීමට මඟක් වී නම්, ඔවුන් පිළිගැනීම, මරණයෙන් ජීවනය ලැබීමක් විනා අන් කුමක් වන්නේ ද?

දෙවියන් වහන්සේ සිය දීමනා ද කැඳවීම ද වෙනස් නොකරන සේක. විජාතීන් වන ඔබ යටගිය දවස දෙවියන් වහන්සේට අකීකරු ව සිටි නමුත්, ජුදෙව්වරුන්ගේ අකීකරුකම නිසා දැන් ඔබ කරුණාව ලබා ඇත. එසේ ම, ඔවුන් දැන් අකීකරු ව සිටින්නේ, ඔබට දක්වන ලද කරුණාව නිසා ඔවුනුත් කරුණාව ලබන පිණිස ය. මන්ද, දෙවියන් වහන්සේ සකල සත්වයන්ට කරුණාව දක්වන පිණිස, සකල සත්වයන් අකීකරුකම නමැති බන්ධනාගාරයෙහි තැබූ සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද | පිලිප්පි 2: 16

ආලේලූයා! ආලේලූයා!
ඔබ ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්,
අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන්
බබළන්නහු ය.
ආලේලූයා!

## සුවිශේෂය | මතෙව් 15: 21–28

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "ස්ත්‍රිය, ඔබේ ශ්‍රද්ධාව මහත් ය."

ජේසුස් වහන්සේ තීර් හා සිදොන් පෙදෙස්වලට වැඩිය සේක. එක් කානානීය ස්ත්‍රියක් ඒ පෙදෙස්වල සිට අවුත්, "දාවිත්ගේ පුත්‍ර වූ ස්වාමීනි, මට අනුකම්පා කළ මැනව: මාගේ දුව බලවත් සේ දුෂ්ටාත්මාවේශ ව සිටින්නී ය"යි කියමින් මොරගැසුවා ය. එහෙත් උන් වහන්සේ ඇයට වචනයකින් වත් පිළිතුරු නුදුන් සේක. උන් වහන්සේගේ ශ්‍රාවකයෝ අවුත්, "මේ ස්ත්‍රිය මොර ගසමින් අප පස්සේ එන බැවින් ඇයට යන්න කිව මැනවැ"යි උන් වහන්සේගෙන් ඉල්ලූහ. උන් වහන්සේ කතා කරමින්, "මා එවන ලද්දේ ඉශ්රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙත පමණකැ"යි වදාළ සේක.

එහෙත් ඇ අවුත් උන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, මට පිහිට වුව මැනවැ"යි කීවා ය. උන් වහන්සේ උත්තර දෙමින්, "දරුවන්ගේ කෑම ගෙන බල්ලන්ට දැමීම යුතු නැතැ"යි වදාළ සේක. එහෙත් ඈ කතා කොට, "එසේය, ස්වාමීනි, බල්ලන් පවා තම ස්වාමිවරුන්ගේ මේසයෙන් වැටෙන කැබලි අවුලා කති"යි කීවා ය. එවිට ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ස්ත්‍රිය, ඔබේ ඇදහිල්ල මහත් ය. ඔබේ කැමැත්ත ලෙස ම ඔබට වේ වා"යි වදාළ සේක. ඒ මොහොතේ පටන් ඇගේ දුව සුවපත් වූවා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



# “ඔබේ ශ්‍රද්ධාව මහත් ය. ඔබේ කැමැත්ත ලෙස ම ඔබට සිදුවේවා”

*සාමාන්‍ය සමයේ විසි වන ඉරුදින - 20-08-2017*

**යෙසායා 56:1,6-7**

**රෝම 11:13-15, 29-32**

**ගීතාවලිය 67:1-2, 4,7**

**මතෙව් 15:21-28**

## හැඳින්වීම

දෙවියන් වහන්සේගේ කරුණාවට සීමා මායිම් නැත. එය කිසියම් පිරිසකට පමණක් සීමා වූවක් නොවේ. දේව අභිමතය සැම දෙනාගේම ගැලවීමයි. එහෙත් ඒ ගැලවීමේ දීමනාව අයිති කර ගැනීම අප සතු කාර්යයකි. ඒ සඳහා දෙවියන් වහන්සේ අප සැමගේ පියාණන් බවත්, අප එතුමන්ගේ ප්‍රියාදර දරුවන් බවත් විශ්වාස කිරීමට අවශ්‍යය. ශුද්ධවූ සභාවේ සක්‍රමේන්තු තුළින් ගලා එන දේව වරප්‍රසාදයේ ජීවිතයට ඇතුළු වීමට අවශ්‍යය. ජාති, කුල, උසස් පහත් භේද පසෙකලා එකම දේව ජනතාවක් ලෙස එකතු වීමට එවිට අපට හැකි වනු ඇත.

## දේව වචනය

දේව පොරොන්දු අයත් වන්නේ ඊශ්‍රායෙල් වංශයට පමණක් යැයි ජුදා ජාතිකයින්ගේ අදහස විය. විදේශිකයින්ට (ජුදා නොවන අයට) ජෙරුසලමේ දේව මාළිගාවට ඇතුළු වීමට පවා තහනම් විය. එහෙත් යෙසායා දිවැසිවරයා ප්‍රකාශ කරන පරිදි දෙවියන් වහන්සේගේ කැමැත්ත නම් සියලු ජාතීන් තමන් වෙතට කැඳවා ගැනීමයි. සමිඳුන්ට ප්‍රේම කර, එතුමන්ගේ සරණ සොයා ගොස්, එතුමන්ගේ අණ පණත් නිසි ලෙස පිළිපදින්නේ නම් විදේශිකයෙකුට වුවද දෙවියන් වහන්සේගේ ගෘහයට ඇතුළු විය හැකි බව යෙසායා ප්‍රකාශ කරයි.

පළමු කියවීමේ යෙසායාගේ වචන සම්පූර්ණ කරමින් කානානීය ස්ත්‍රියගේ දියණිය සුව කිරීම තුළින් ජේසුන් වහන්සේ තමන් වහන්සේගේ ශුභාරංචිය ලෝක වාසී සියළු දෙනාටම අයිති බව පෙන්නුම් කළ සේක. විජාතිකයින් වෙසෙන පළාතක ගමන් ගන්නා ජේසුන් වහන්සේට මෙම ස්ත්‍රිය මුණ ගැසේ. මෙම සිද්ධිය පිළිබඳ මතෙව් තුමාගේ විස්තරයේ මාක් තුමාගේ විස්තරයට වඩා සැළකිය යුතු වෙනස්කම් කීපයක් ඇත. ඇයව සිරියාවේ පිනීසිය වෙනුවට කානානීය කාන්තාවක් ලෙස හැඳින්වීම එකකි. කාන්තාව සහ ජේසුන් වහන්සේ අතර සංවාදය මාක් සුවිශේෂයට වඩා දිගය. ජේසුන් වහන්සේ කාන්තාවගේ ශ්‍රද්ධාව ගැන ප්‍රශංසා කිරීම තව එකකි. එක් එක් සුවිශේෂකවරයාට තිබූ අරමුණු ද මේ වෙනස්කම් තුළින් දැකගත හැකිවේ. කානානිවරුන් සහ ඊශ්‍රායෙල්වරුන් අතර දුරාතීතයේ පටන් විරසකයන් පැවතිණි. මාක් තුමා සුවිශේෂය රචනා කළේ ගැලවීමේ සුභාරංචිය පළමුකොට ජුදෙව්වරුන්ටත් අනතුරුව විජාතීන්ටත් හිමිවන බව පැවසීමටයි. ජුදෙව්වරු සහ විජාතීන් අතර පැවති දුරස්ථබව බිඳිය හැක්කේ විශ්වාසය තුළින් පමණක් බව ජුදෙව්වරුන්ට පෙන්වා දීම මතෙව් තුමාගේ අරමුණ විය.



පාවුලු තුමා දේව ආදරයේ විශ්වීය බව ඉතා පැහැදිලිව ප්‍රකාශ කරයි. විජාතිකයින්ට ශුභාරංචිය ප්‍රකාශ කරන්නට හැකිවීම පිළිබඳව එතුමා සතුටු වෙයි. දෙවියන් වහන්සේගේ පණිවිඩය ඊශ්‍රායෙල් ජනතාව හරහා මුළු ලෝකයට ම ලැබෙන්නට සැලැස්වීම දේව සැලැස්ම විය. එහෙත් ජුදෙව්වරු මෙසියස් තුමාව ප්‍රතික්ෂේප කළ බැවින් නැවත විජාතීන් හරහා දෙවියන් වහන්සේගේ කරුණාව ජුදෙව්වරුන්ට ද ලැබෙන බව පාවුලු තුමා වැඩි දුරටත් පවසයි.

## මෙනෙහි කිරීම

අදට නියමිත සුවිශේෂය කිතුනුවන් තුළ ව්‍යාකූලත්වයක් ඇති කරන බව නොරහසකි. යක්ෂාවේශ වූ තම දියණිය සුව කරන්නැයි විජාතික ස්ත්‍රියක කරන ඉල්ලීම ක්‍රිස්තුන් වහන්සේ පළමු අවස්ථාවේ දී ප්‍රතික්ෂේප කරන සේක. සතුරාට වුවද ප්‍රේම කරන්නැයි ඉගැන්වූ අප ස්වාමින් වහන්සේ තම ජාතියට අයත් නොවූ නිසාවෙන් අසරණ ස්ත්‍රියකට පිහිට වන්නට අදිමදි කළේ ඇයි? තමන්ව පාවා දෙන්නට සිටි ගෝලයාගේ පවා පාද සෝදන්නට තරම් නිහතමානී වූ එතුමාණෝ අන්‍ය ජාතියකට 'බල්ලන්' යැයි අපහාස කරාවිද?



මෙම සිද්ධිය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ක්‍රියා කලාපය එතුමන්ගේ ඉගැන්වීම් වලට පටහැනි යැයි බැලූ බැල්මට සිතේ. එතරම් දැනුම් තේරුම් නොමැති කෙනෙක් හෝ ක්‍රිස්තු විරෝධියෙක් මෙය ක්‍රිස්තුන් වහන්සේට වැරදුණු අවස්ථාවක් ලෙස අර්ථ කථනය කිරීමට වුවද ඉඩ ඇත.

කානානීය ස්ත්‍රිය අරභයා ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රතිචාරය නිවැරදිව තේරුම් බේරුම් කරගැනීමට නම් එවකට තිබූ ආගමික, සමාජ හා සංස්කෘතික පසුබිම පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. තමන් දෙවියන් වහන්සේ විසින් විශේෂයෙන් තෝරාගනු ලැබූ ජාතියක් යැයි ජුදෙව්වරු තදින් ම ඇදහූහ. විජාතිකයෙකුව මුහුණට මුහුණ හමුවීම පවා සැළකුණේ ඉතා අසුභ නිමිත්තක් ලෙසිනි. ජුදෙව්වරු මොනම කරුණක් නිසාවත් විජාතිකයකුගේ නිවෙසට ගොඩවැදුණේවත්, ඔවුන්ට තම නිවෙස්වලට ආරාධනා කළේවත් නැත. පිටස්තර ජාතිකයින්ට 'බල්ලන්' යැයි ආමන්ත්‍රණය කිරීම එකල ජුදෙව්වරුන්ගේ සාමාන්‍ය සිරිතක් විය.

ජේසුන් වහන්සේ වෙතට පැමිණෙන කාන්තාව පළමු අවස්ථාවේ 'දාවිත්ගේ පුත්‍රයාණෙනි' සහ 'ස්වාමිනී' යන ආමන්ත්‍රණ දෙකම භාවිතා කරයි. පළමු ආමන්ත්‍රණය ජේසුන් වහන්සේගේ ජුදා ජාතිකත්වය ඉස්මතු කරන අතර දෙවැන්න උන්වහන්සේගේ දේවත්වය සහ විශ්වීයත්වය මතු කරයි. පැරණි හීබෲ ලියවිලි තුළ මෙසියස් තුමා හැඳින්වූයේ දාවිත්ගේ පුත්‍රයා යනුවෙනි. විජාතිකයෝ මෙසියස් තුමා ගැනවත්, දාවිගේ පරපුරෙන් පැවත එන ගැලවුම්කරුවෙකු ගැනවත් කිසිදා විශ්වාස නොකළහ. ඔවුන්ට කවදාවත් ගැලවීම පිළිබඳ පොරොන්දුවක් හෝ බලාපොරොත්තුවක් නොවීය. එවැනි පසුබිමකින් යුත් කාන්තාවක් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම සැබවින් ම මවිතයට කරුණකි. එහෙත් මෙම කාන්තාව 'ස්වාමිනී' යැයි ඇමතීම තුළින් ඇය ජේසුන් වහන්සේ ගැලවුම්කාරයාණන් බවද දේව පුත්‍රයාණන් බවද පිළිගත් බව පෙනේ.

ජේසුන් වහන්සේගේ මුල් පිළිතුරෙන් පසු නොබසින දෙවනවර උන්වහන්සේට ආමන්ත්‍රණය කරන්නේ 'ස්වාමිනී' යනුවෙන් පමණි. දියණියව සුව කරගැනීමේ දැඩි අවශ්‍යතාවය නිසා කම්පාවට පත්ව සිටි ඇය වචන භාවිතා කළේ තොරා බේරාගෙන නොවන්නට ඉඩ ඇත. කෙසේ වුවත්, මෙසේ ආමන්ත්‍රණය කිරීම තුළින් ඇය ජේසුන් වහන්සේගේ ජුදෙව්වරුන්ට ඇති සම්බන්ධතාවයට වඩා උන්වහන්සේගේ විශ්වීයත්වය ඉස්මතු කළාය. එතුළින් ඇය ගැලවුම්කාරයාණන්ගේ මෙහෙවර භෞතික සීමාවන් වලින් එහාට පැතිර යා හැකි බව තමන් විශ්වාස කරන බව පෙන්වූවාය.

ක්‍රිස්තුන් වහන්සේට තවදුරටත් ඇගේ විශ්වාසය මැන බැලීමට අවශ්‍ය විය. ඇගේ ආයාචනය හුදු රඟපෑමක් විය නොහැකිද? එකල සාමාන්‍ය ව්‍යාවහාරයේ වූ 'බල්ලන්' පිළිබඳ යෙදුම භාවිතා කරමින් ජේසුන් වහන්සේ පිළිතුරු දෙන්නේ ඇයට අපහාස කිරීමේ අරමුණින් නොව ඇගේ විශ්වාසයේ තරම පරීක්ෂා කිරීමටය. ඇගේ විශ්වාසය අව්‍යාජය. ඇය දෙන පිළිතුරෙන් ඒ බව වටහාගන්නා ස්වාමින් වහන්සේ වහාම ඇගේ ඉල්ලීම ඉටුකර දෙන සේක. එතැනින් නොනැවතී උන්වහන්සේ ඇගේ විශ්වාසය පිළිබඳව ඇයට ප්‍රශංසාවක් ද කළ සේක.

ගැලවීමේ ශුභාරංචිය ජුදා ජාතිය හරහා සකළ ලෝකවාසීන්ට ම බෙදා දීම දෙවියන් වහන්සේගේ සැලැස්ම විය. ක්‍රිස්තුන් වහන්සේ ද තම පණිවිඩය පළමුව ජුදෙව්වරුන්ට සමීප කරන්නට වෙහෙසෙන්නේ එහෙයිනි. එහෙත් එමනිසා ම අන්‍ය ජාතිකයින්හට පිහිට නොවිය යුතු යැයි හැඟීමක් එතුමන් තුළ තිබුණායැයි සිතීම අනුවණකමක් වන්නේ මෙම සිද්ධියට පෙරද ජේසුන් වහන්සේ විජාතිකයින්ට පිහිට වී ඇති බැවිනි (ශු. මතෙව් 8:5-10 බලන්න). ක්‍රිස්තුන් වහන්සේට අවුරුදු 700 කට පමණ පෙර විසූ යෙසායා දිවැසිවරයාද දේව සැලැස්මේ එම ස්වභාවය ලියා තබා ඇත (අද පළමු කියවීම). පූර්ණ මනුෂ්‍යයා ද පූර්ණ දෙවියන් ද වූ ක්‍රිස්තුන් වහන්සේ මේ බව හොඳින්ම දැන සිටි බව නිසැකය.



විජාතික ස්ත්‍රියගේ ඇදහිල්ල තුළින් ස්වාමින් වහන්සේ අපට දෙන පණිවිඩය කුමක්ද? අපේ විශ්වාසයද පරීක්ෂාවට ලක්වන අවස්ථා ඇද්ද? ඒවාට අපි කෙසේ මුහුණ දෙමුද? කානානීය ස්ත්‍රියට ලැබුණු මුල් පිළිතුර වැනි ප්‍රතිචාරයක් අපට ලැබුණොත් කුමක් වෙයිද? ඔබගේ ඉල්ලීම ඉටුකර නොදුන් දෙවියන් ගෙන් වැඩක් නැතැයි සිතා විශ්වාසය නැතිකර නොගනීවිද? ඔබට මදිපුංචිකමක් වූවායැයි නොසිතේවිද? දරුවා වෙනුවෙන් වුවත් මෙතරම් නින්දා අපහාස විඳින්නට ධෛර්යය තිබේවිද?

යාච්ඤාව තුළ අපේ ඉල්ලීම් ඉටුවන්නට ප්‍රමාද වනවිට අපේ ප්‍රතිචාරය කුමක් වේවිද? සමහරවිට අවශ්‍ය දේ නොලැබීම නිසා අවට සිටින අයගේ සිනහවට පවා ලක්වන්නට සිදුවනවා විය හැක. හිත මිතුරන් දිනෙන් දින ඉහළට යද්දී අපි එකම තැනක සිටිනවා වගේ දැනෙනු ඇත. දරාගන්නට බැරිතරම් අසරණ කමක් දැනෙන අවස්ථා ඇත. එවිට තව දුරටත් විශ්වාසය තුළ රැඳී සිටීමට අපට හැකිද?

ක්‍රිස්තුන් වහන්සේ ස්ත්‍රියගේ ඉල්ලීම එකවර ඉටු නොකළේ ඇයව හරවා යැවීමට නොව ඇගේ විශ්වාසය සහ ඉවසීම තුළින් අපට ආදර්ශයක් දීමට බව මෙම සිද්ධිය විවරණය කරන කොන්ස්තන්තිනෝපල්හි ශු. ජෝන් ක්‍රිසොස්ටම් මුනිතුමා පවසයි. අපට දැනෙන වේදනාව හෝ ලැජ්ජාව, වෛරයක්, පළිගැනීමක් බවට පත්කර නොගෙන තව තවත් බැහැපත් වන්නට හැකිනම් ක්‍රිස්තුන් වහන්සේගේ මුවින් ප්‍රශංසා ලැබීමට අපට ද සුදුස්සන් විය හැකිය.

බෞතීස්මය තුළින් දේව දරුවන් වූ අප සැම නව ඊශ්‍රායෙක් ජාතිය වම්හ. දෙවියන් වහන්සේ අපව මුලින් තෝරාගෙන ඇත්තේ අන් අයට ශුභාරංචිය පතළ කිරීම සඳහාය. කිතුනුවකු වීම තුළ මහත් ආශිර්වාදයක් මෙන් ම බොහෝ දෙනා අමතක කර දමා ඇති භාරදූර වගකීමක් ද ඇත. ගැලවීමේ කාර්යය සම්පූර්ණවීම සඳහා දෙවියන් වහන්සේ කිසියම් ආකාරයකින් එය ආරම්භ කළ යුතුය. පැරණි ගිවිසුමේ ඊශ්‍රායෙල් ජනතාව තුළින් ද අනතුරුව ක්‍රිස්තුන් වහන්සේගේ සිට අපෝස්තුළුවරුන්ගෙන් පැවත එන කතෝලික සභාව හරහා ද දෙවියන් වහන්සේ එම කාර්යයට ජනතාව කැඳවන සේක.

ඔබත් මමත් එසේ කැඳවීම් ලද්දන් වෙමු. දෙව් පියාණන්ගේ මෙම ප්‍රේමාන්විත ඇරයුමට පිටුපා සිටින්නෙමු නම් අප විසින් ම අපව විජාතීන්ගේ ගොඩට ඇද දැමීම වැළැක්විය නොහැක. පැරණි ගිවිසුමේ දී තෝරාගත් සෙනඟට අයිති වීමේ වරම ලැබුණේ ලේ උරුමයෙනි. එහෙත් නව ගිවිසුමේදී එසේ නොවේ. එය තමන්ගේ තෝරාගැනීමකි. දෙවියන් වහන්සේට ප්‍රේම කරන, උන්වහන්සේගේ අණ පණත් පිළිපදින සියළු දෙන දේව දරුකම ලබති. දෙවියන්

වහන්සේට ආදරය කරන බව වචනයෙන් පමණක් ප්‍රකාශ කිරීම නොසෑහේ. බෞතීස්මය ලබා සක්‍රමේන්තු ජීවිතයට ඇතුළු වී, ශුද්ධවූ සභාව සමඟින් ශුභාරංචිය පතළ කිරීමේ වගකීම භාරගෙන එය ප්‍රායෝගිකව පෙන්නුම් කළ යුතුය. දෙවියන් වහන්සේ තුළ අප සැමට ඇත්තේ එකම පියෙකි. ඒ නිසා අප එකම ජාතියකි. සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස හෝ කුල වශයෙන් භේද අප අතර නැත. දෙවි පියාණෝ කිතුනු නොකිතුනු සැමට එකසේ ප්‍රේම කරන්නාක් මෙන් අප ද සැමදෙනා තුළ සහෝදරත්වය ගොඩනඟමින් දේව රාජ්‍යය පිළිබඳ පණිවිඩය මුළු ලෝකයට ම ගෙනයන්නට උත්සහා ගනිමු.

***"ස්වාමිනී, සියළු ජාතීන් ඔබේ රාජ්‍යය තුළට කැඳවන්නට අපට පිහිට වුව මැනව. ගැලැවීමේ ශුභාරංචිය මුළු විශ්වය පුරා පතළ කිරීමට අපව ශක්තිමත් කළ මැනව"***

*irudinasupuwatha@gmail.com*